# සී/ස ලංකා නැව් සංස්ථාව
# (වරාය හා නාවික අමාත්‍යාංශය)

# ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා පවතින ඇබෑර්තුව පිරවීමට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය දරන සුදුසු ඉල්ලුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ගොඩබිම් නම්කළ තැනැත්තා තනතුර - කොන්ත්‍රාත් පදනම (ඇබෑර්තු 01)

**සුදුසුකම්** : කපිතාන්වරයෙක් (Master) ලෙස 1 වෙනි පන්තියේ නිපුණතා සහතිකය (COC)

කපිතාන්වරයෙක් (Master Mariner) වශයෙන් අවම වශයෙන් වසර 03 පළපුරුද්ද (විශේෂයෙන් තොග බහාලුම් නෞකා වල)

**පළපුරුද්ද** : පිළිගත් නැව් හිමි මෙහෙයුම් සමාගමක ගොඩබිම් නම්කළ තැනැත්තෙකු (DPA තනතුර) ලෙස අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද

**වැටුප** : මාසික දීමනාව රු. 450,000/- කි.

**රැකියා විස්තරය**

**වගකීම්**

- ආයතනයේ ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය (SMS) සන්නිවේදනය කිරීම සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම.
- තාක්ෂණික අංශය සමග සාකච්ජා කොට කපිතාන්වරු සහ ආයතනයේ කළමනාකාරීත්වයට උපදෙස් දීම හා සම්බන්ධීකරණය කිරීම.
- තාක්ෂණික අංශ ප්‍රධානියා සමග සාකච්චා කර (in consultation) නැව් සංස්ථාවේ සියලුම නැව් වල වෙරළාශ්‍රිත හා නැව හා සම්බන්ධ (both shore board & on board) ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය (SMS)/ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම.
- විවිධ නැව් වාර්තා නිරතුරුව පරීක්ෂා කරමින් නැව් වල මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීම.
- නැවේ ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය අධීක්ෂණය (SMS) සහ වැඩි දියුණු කිරීම සහ නැවේ වාර්තා කිරීම් (Ship Board Recording) පසු විපරම් කිරීම.
- සියලුම ව්‍යවස්ථා හා වර්ගීකරණ සමාජ සමීක්ෂණ (Classification Society Surveys) සම්බන්ධයෙන් නියෝග දීම සහ නියමිත වෙලාවට ක්‍රියාත්මක කිරීම.
- ප්‍රමාණවත් සම්පත් සහ ආයතනය මගින් ලැබිය යුතු වෙරළ ආශ්‍රිත (shore based support) අවශ්‍ය සහයෝගය සැපයීම තහවුරු කිරීම සහ අලුත්වැඩියා හා අමතර කොටස් ප්‍රසම්පාදනය තහවුරු කිරීම.
- ගොඩබිම් නම්කළ නිලධාරී (DPA තනතුර) කටයුතු ඇගයීම නිරීක්ෂණය කිරීම විශේෂයෙන් දුරස්ථව හා අඛණ්ඩව නිරීක්ෂණය කිරීම නැවේ ආරක්ෂිත කළමනාකරණ පද්ධතියේ (SMS) සඵලතාවය සමාලෝචනය කිරීම.
- නැව් කාර්ය මණ්ඩලය කළමනාකාරීත්වයේ අඩුපාඩු නොගැළපීම්, අනතුරු හා අනතුරු දායක සිදුවීම් වාර්තා කිරීම, විමර්ශනය කිරීම සහ විශ්ලේෂණය කිරීම.
- කළමනාකරණ සමාලෝචන කමිටු රැස්වීම් සංවිධානය කිරීම, සම්බන්ධීකරණය කිරීම හා එහි වාර්තා තැබීම හා නඩත්තු කිරීම.
- International Maritime Organization අවශ්‍යතාවයන්ට අනුකූලව සහ නූතන මාර්ගෝපදේශ අනුගමනය කරමින් අදාළ බලධාරීන්ට අවශ්‍ය වූ විට අතිරේක අත් පොත් (additional manuals) සම්පාදනය කිරීම.
- හදිසි අවස්ථාවන් ආවරණය වන පරිදි ship/ show contingency plans සමාලෝචනය කිරීම හා සම්පාදනය කිරීම.
- ජාත්‍යන්තර රෙගුලාසි වලට අනුකූලව නාවික හා නැව් මත (Marine shipboard) ආරක්ෂාව සහ පාරිසරික ප්‍රතිපත්ති සුරක්ෂිත කිරීම.
- තාක්ෂණික දෙපාර්තුමේන්තු ප්‍රධානියා සහ චාටරින් සහ ඒජන්සි දෙපාර්තුමේන්තු ප්‍රධානීන් සමග සම්බන්ධීකරණය වෙමින් නැව් කපිතාන්වරුන් (Masters) වෙත මුහුදු ගමන් පිළිබඳ උපදෙස් නිකුත් කිරීම.
- විදේශීය වරාය නියෝජිතයින් (Foreign Port Agency) වෙත උපදෙස් ලබාදීම.

**වයස් සීමාව :** වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**ප්‍රතිලාභ**

1. සේ.අ.අ/සේ.නි.භා.අ.
2. පාරිතෝෂික පණතට අදාල වන පරිදි පාරිතෝෂිකය
3. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගතකිරීම් රක්ෂණ ආවරණය
4. සම්පූර්ණ පුද්ගලික අනතුරු රක්ෂණ ආවරණය
5. සන්නිවේදන වියදම් ආපසු ගෙවීම්

**පොදු උපදෙස්**

- සියලුම අයදුම්පත් සමග අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල පිටපත් තමා විසින්ම සහතික-කොට උප්පැන්න සහතිකය හා අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව ලියාපදිංචි තැපෑලෙන් **2021 අගෝස්තු 27** දින හෝ ඊට ප්‍රථම **සභාපති, සී/ස ලංකා නැව් සංස්ථාව, නො.17, MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් මාවත), කොළඹ 01** ලිපිනයට හෝ **chairman@cscl.lk /hr@cscl.lk** යන විද්‍යුත් තැපෑලට ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.
- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.
- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්ක-රුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

**සභාපති**
**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**
**අංක 27, MICH ගොඩනැගිල්ල**
**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය)**
**කොළඹ 01**

**වැඩි විස්තර සඳහා (+94) 011 239 4624 / දිගුව 218 - නීති /රක්ෂණ සහ මානව සම්පත් අංශය**
**2021 අගෝස්තු 14**